# සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල) නිලධාරී සංගමය.

ALL ISLAND SAMURDHI DIWALOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES UNION

ලි.ප. අංකය 7570 නිළ වෙබ් ලිපිනය oisbku.com

අංක 68 ,
දෙහිදෙනිය
පේරාදෙනිය
2020.06.04

---

ප්‍රිය සොයුර සොයුරිය !

## ස්තුතිය ප්‍රකාශ කිරීම හා සංගමයේ ක්‍රියාකාරිත්වය

ලෝකය පුරා පැතිරයමින් පවතින කොවිඩ් 19 වෛරස් තත්වය හමුවේ ශ්‍රී ලංකාව තුල කොවිඩ් 19 වෛරසය පැතිරයාම වැලැක්වීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කළ වැඩපිළිවෙල හමුවේ අපගේ ප්‍රතිලාභීන් මෙන්ම ජීවනෝපාය අහිමිවූ ලක්ෂ සංඛ්‍යාත ජනතාවකගේ ආර්ථික අපහසුතාවය සඳහා අස්වැසිල්ලක් සැපයීම වෙනුවෙන් කැපවෙමින් සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ගේ රැකියාවේ ගෞරවය ආරක්ෂා කරමින් කටයුතු කිරීම හා සමෘද්ධි සංවර්ධන දෙපාර්ථමේන්තුවේ ඇති හැකියාව,වැදගත්කම,වටිනාකම හා අවශ්‍යතාවය රටේ දේශපාලනාධිකාරියට මෙන්ම රටේ ජනතාවට දැනෙන පරිදි දිවිහිමියෙන් කටයුතු කරමින් කළ සේවාවට අප නිළධාරින් හට අප සංගමයේ හෘදයාංගම ස්තුතිය ප්‍රථමයෙන්ම පුදකර සිටින බව මෙයින් දන්වා සිටිමි.

අප සංගමය ඔබ වෙනුවෙන්ම පෙනී සිටිමින් කැපවෙමින් ඔබගේ අයිතිවාසිකම් මූලිකත්වයෙහිලා සලකන බැවින් කිසිදු දේශපාලන පක්ෂයක් සමඟ අවශ්‍යතාවයට වඩා මිතුරුකමක් හෝ සතුරුකමක් නොපවත්වන බව සිහිපත් කරමි.එසේම සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ගේ මිතුරුකම පමණක් අප සැමගේ ජයග්‍රහනය සේ සලකමි.එම නිසාම වෘත්තීය සමිති කාර්යභාරය හොඳින් වටහාගෙන කටයුතු කරණ වෘත්තීය සංගමයක් ලෙස ඔබ විසින් සිදුකළ එම උදාර මෙහෙවර උදෙසා වටිනාකමක් ලබාදෙනු වස් ඇදිරිනීතිය පවා නොසලකමින් පසුගිය කාලය පුරාවට අධ්‍යාක්ෂ ජනරාල් තුමන් සමඟ කටයුතු කරමින් පහත සඳහන් දිරිගැන්වීම් දිනා දීමට හැකි වීම අප සංගමය ලද සුවිශේෂී ජයග්‍රහනයක් ලෙස දන්වා සිටිමි.

1. නිවාඩු දිනයන් පවා කැපකරමින් කටයුතු කිරීම වෙනුවෙන් දින 05 ක් සඳහා දිනක වැටප බැගින් ලබා ගැනීමට අවස්ථාව සලසා දීමට කටයුතු කිරීම. ( වැටුප් ගලපා නොමැති නිළධාරීන් සඳහා රු 1000 ක් වනසේ )

2. පසුගිය කාලය තුල ඔබගේ ජංගම දුරකථනය රාජකාරී කටයුතු වලට යොදා ගැනීමට කටයුතු කිරීම වෙනුවෙන් රු 1000 ක දුරකථන දීමනාවක් ලබා ගැනීමට අවස්ථාව සලසා දීමට කටයුතු කිරීම.

3. එම කාලය පුරාවට සිදුකළ විශේෂ රාජකාරී කටයුතු වෙනුවෙන් ගමනාගමනය සඳහා රු 2000 ඉන්ධන දීමනාවක් ලබා ගැනීමට අවස්ථාව සලසා දීමට කටයුතු කිරීම.

4. මෙතෙක් කල් නොවිසඳුන අපගේ ණය ප්‍රශ්ණය වෙනුවෙන් සමෘද්ධි බැංකු සමිතිය වෙතින් රු 1000000 ක ණය මුදලක් දිගුකාලීනව ගෙවීමේ පදනමින් ලබා ගැනීමට අවස්ථාව සලසා දීමට කටයුතු කිරීම.( මෙම ණය වැඩසටහන වෙනුවෙන් නිකුත් කර ඇති චක්‍රලේඛණයේ ඇති නොගැලපීම් වෙනස් කිරීම සඳහා කටයුතු මේ වන විටත් සිදුකරමින් පවතින බව ද සිහිපත් කරමි.)

5. අපට ලබාදුන් දීමනා සම්බන්ධයෙන් හා විශේෂයෙන් රු 5000 ක දීමනාව ලබාදීමට සකස්කළ කමිටුවේ අධීක්ෂණය හා කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු කිරීමට අප නිළධාරීන්ට ලබාදීමට විරුද්ධව ග්‍රාම නිළධාරීන්,ආර්ථික සංවර්ධන නිළධාරීන්,කෘෂි පර්යේෂණ නිළධාරින් ගේ ඇතැම් වෘත්තීය සංගම් අපහට චෝදනා එල්ල කරමින් අපගේ වෘත්තිය මෙන්ම අපවද හැල්ලුවට ලක්කරමින් ගෙනගිය වෘත්තීය ක්‍රියා මාර්ග හමුවේ අපගේ අනෙකුත් වෘත්තීය සංගම් මුනිවත රකිද්දී අප නිළධාරීන්ගේ මෙන්ම අප ආයතනයේ ගෞරවය ආරක්ෂා කරගැනීම උදෙසා ස්වර්ණවාහිණිය තුලින් පැයක සජීවී වැඩසටහනක් සංගමයේ සභාපති තුමන්ගේ සහභාගීත්වයෙන් සිදු කරමින් ඔවුන්ගේ අවලාද චෝදනා නැගීම නවතාලීමට කටයුතු කිරීම තුලින් අපගේ ගෞරවය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.( 2020.05.25 දින පස්වරු 3.00 පැයට )